# ගර්භාෂ පිළිකා



ජාතික පිළිකා මර්දන වැඩසටහන
සෞඛ්‍ය අමාත්‍යාංශය

# ගෝලීය තත්ත්වය

**නව රෝගීන් වාර්තාවීම**

ලොව පුරා රෝගීන් 420,368 (2022)

**මරණ**

2022 දී ගර්භාෂ ආශ්‍රිත පිළිකා මරණ 97,723 කි.

# ශ්‍රී ලංකාවේ ගර්භාෂ පිළිකා තත්ත්වය 2005 – 2021

2021 වර්ෂයේ දත්ත අනුව ගර්භාෂ පිළිකා ශ්‍රී ලාංකික කාන්තාවන් අතර 6වෙනියට වැඩිම පිළිකාව වේ.



## ශ්‍රී ලංකාවේ ගර්භාෂ පිළිකා පිළිබඳ වයස ප්‍රමාණීකෘත අනුපාත, 2005-2021







Figure 42: Age Standardized Incidence Rates of Uterine cancer in Sri Lanka, 2006-2021

# ශ්‍රී ලංකාවේ ගර්භාෂ පිළිකා තත්ත්වය 2021






# ගර්භාෂයේ පිහිටීම






# අවදානම් සාධක



## 1. හෝර්මෝන සාධක

(ප්‍රමාණවත් ප්‍රොජෙස්ටරෝන් නොමැතිව ඊස්ටජන්වලට නිරාවරණය වීම)

එන්ඩොමෙට්‍රියල් ප්‍රගුණනය වැඩි කරයි.

- අඩු වයසින් මල්වරවීම හෝ ආර්තවහරණය ප්‍රමාද වීම
- දරුවන් නොමැති බව
- හෝමෝන ප්‍රතිස්ථාපන ප්‍රතිකාරය (HRT) - ඊස්ට්‍රජන් සමඟ පමණක්
- ටැමොක්සිෆෙන් චිකිත්සාව (පියයුරු පිළිකා ප්‍රතිකාර සඳහා භාවිතා කරයි)
- පොලිසිස්ටික් ඩිම්බකෝෂ සින්ඩ්‍රෝමය (PCOS)

# අවදානම් සාධක



## 2. ජීවන රටා ආශ්‍රිත සාධක

- තරබාරුකම
- ශාරීරික අක්‍රියතාව
- ආහාර වේල: අධික මේද සහ අඩු තන්තු සහිත ආහාර

## 3. ජානමය සහ පවුල් ඉතිහාසය ආශ්‍රිත සාධක

- Lynch Syndrome (Hereditary Non-Polyposis Colorectal Cancer, HNPCC)
- Family History of Endometrial or Colorectal Cancer

# අවදානම් සාධක



## 4. රෝගී තත්ත්වයන්

- දියවැඩියා රෝගය
- අධි රුධිර පීඩනය

## 5. වෙනත් සාධක

- වයස - ආර්තවහරණයෙන් පසු, අවු. 50 - 60 කාන්තාවන්
- විකිරණ චිකිත්සාව: ශ්‍රෝණි විකිරණ

# ආරක්ෂිත සාධක



1. **උපත් පාලන පෙති (OCPs):**
ප්‍රොජෙස්ටරෝන් සමඟ ඊස්ට්‍රජන්වල බලපෑම්වලට විරුද්ධ වීමෙන් අවදානම අඩු කරයි.

2. **දරුවන් ප්‍රසූත කර තිබීම**

3. **ශාරීරික ක්‍රියාකාරකම් සහ සෞඛ්‍ය සම්පන්න ආහාර වේලක් ගැනීම**

# රෝග ලක්ෂණ

## 1. අසාමාන්‍ය ගර්භාෂ රුධිර වහනය

- ආර්තවහරණයෙන් පසු රුධිර වහනය (Post Menopausal Bleeding)
- අන්තර් ඔසප් රුධිර වහනය (Intermenstrual bleeding)
- අක්‍රමවත් හෝ අධික ඔසප් රුධිර වහනයක්

## 2. යෝනි මාර්ගයෙන් අසාමාන්‍ය රුධිර/ශ්‍රාවයක් වහනය

- දියරමය, රෝස හෝ සුදු පැහැති විය හැක
- ඔසප් වීම අතර හෝ ආර්තවහරණයෙන් පසුව සිදුවිය හැක

# රෝග ලක්ෂණ

## 3. ශ්‍රෝණි වේදනාව

ශ්‍රෝණි ප්‍රදේශයේ අපහසුතාවයක් හෝ වේදනාවක් (Dysmennohroea)

## 4. නිතර මුත්‍රා කිරීම හෝ මුත්‍රා කිරීමේ අපහසුතාව -

මුත්‍රාශය තද වීම නිසා

# ගර්භාෂ පිළිකා කලින් හඳුනා ගැනීමේ පරීක්ෂණ

★ රෝග ලක්ෂණ නොමැති, අවදානම අඩු කාන්තාවන් සඳහා කලින් හඳුනාගැනීමේ පරීක්ෂා නිර්දේශ නොකරයි.

★ මන්ද අඩු සිදුවීම් සහ ඵලදායී පරීක්ෂණ මෙවලම් නොමැතිකම.

## අධි අවදානම් සහිත හෝ රෝග ලක්ෂණ සහිත කාන්තාවන් සඳහා නිර්දේශිත පරීක්ෂණ

- අල්ට්‍රා සවුන්ඩ් (TVS):

එන්ඩොමෙට්‍රියල් ඝණකම තක්සේරු කිරීමට භාවිතා කරයි.

- PIPELLE ASPIRATION
- HYSTEROSCOPY
- D & C (එන්ඩොමෙට්‍රියල් බයොප්සි)

ජාතික පිළිකා මර්දන වැඩසටහන
සෞඛ්‍ය අමාත්‍යාංශය

No.555/5, මහජන සෞඛ්‍ය සංකීර්ණය,
ඇල්විටිගල මාවත, කොළඹ 05

0112368627

https://www.nccp.health.gov.lk

https://www.facebook.com/NCCPSL




ස්තුතියි